# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශවල ප්‍රගතිය ජාත්‍යන්තරයට ඉදිරිපත් කරයි - 2026 ජූලි

සුවතා සංචාරක, සාගර හා කිමිදුම්, සංස්කෘතික, අධ්‍යාපනික සහ ව්‍යාපාරික සංචාරක ක්ෂේත්‍රවල වැදගත් වැඩසටහන් හා ජයග්‍රහණ රැසක් හරහා ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සිය ගෝලීය ස්ථානය තවදුරටත් ශක්තිමත් කරමින් සිටී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) විසින් මෑතකදී සංවිධානය කරන ලද ඉහළ මට්ටමේ වැඩසටහන් අතර ඉන්දියානු නිර්මාණාත්මක කණ්ඩායමක් සමඟ පැවැත්වූ සුබෝපභෝගී සුවතා සංචාරක වැඩසටහන, නැගෙනහිර පළාතේ සාගර හා කිමිදුම් හඳුනාගැනීමේ සංචාරය, මහනුවර ඇසළ පෙරහැර සඳහා බහුභාෂා සජීවී විස්තර විකාශන වැඩසටහන, ඉන්දියාව, ඩුබායි සහ එක්සත් රාජධානිය ඉලක්ක කරගත් ගමනාන්ත විවාහ ප්‍රවර්ධන වැඩසටහන් සහ ජාත්‍යන්තර සංස සම්මේලනයේ 60 වැනි සංවත්සරය සඳහා වන සූදානම් කිරීම් ඇතුළත් වේ.

මෙම ක්‍රියාකාරකම් මගින් ශ්‍රී ලංකාවේ විවිධාකාර සංචාරක ආකර්ෂණයන් ඉස්මතු කරන අතර, සුවතා, සංස්කෘතික, වික්‍රමාන්විත සහ ආධ්‍යාත්මික සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ස්ථානය තවදුරටත් තහවුරු කරයි. විශේෂ අවස්ථාවක් ලෙස, ශ්‍රී ලංකාව ලොව හොඳම සංචාරක ගමනාන්ත අතරින් එකක් ලෙස ජාත්‍යන්තර පිළිගැනීම් කිහිපයක්ද ලබාගෙන ඇති අතර, එමගින් දිවයිනේ ගෝලීය ආකර්ෂණය තවදුරටත් තහවුරු වී ඇත.

පසුගිය මාස කිහිපය තුළ සංචාරක පැමිණීම් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2026 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව සංචාරකයින් 135,643 දෙනෙකු පිළිගත් අතර, මැයි මාසයේදී එම සංඛ්‍යාව 145,745ක් වූ අතර ජූනි මාසයේදී 124,551ක් විය. ජූලි මාසයේ පළමු සතිය තුළ සංචාරක පැමිණීම් 34,721ක් වාර්තා වූ අතර, ගෝලීය අභියෝග මධ්‍යයේ වුවද ජාත්‍යන්තර සංචාරකයින්ගේ අඛණ්ඩ උනන්දුව එමගින් පෙන්නුම් කරයි. මෙම සංඛ්‍යා ලේඛන මගින් සංචාරක ක්ෂේත්‍රයේ ශක්තිමත්භාවය සහ රටේ ප්‍රධාන විදේශ විනිමය උපයන අංශයක් ලෙස එහි දායකත්වය පැහැදිලි වේ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) ව්‍යාපාරික සංචාරක (MICE Tourism) ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යාමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ආසියා පැසිෆික් ළමා රෝග විශේෂඥ සම්මේලනය සහ සර්ප විද්‍යාව පිළිබඳ ලෝක සම්මේලනය වැනි ප්‍රධාන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මෙන්ම ඉන්දියාව ඇතුළු රටවලින් පැමිණෙන ආයතනික දිරිගැන්වීම් කණ්ඩායම් සඳහා වන වැඩසටහන් ද ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමට එය සමත් වී ඇත.

කර්මාන්තයේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු හා හඳුනාගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, ඉදිරියේදී පැවැත්වීමට නියමිත MICE Expo සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන මගින් ව්‍යාපාරික සංචාරක ක්ෂේත්‍රයේ කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ ස්ථානය තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

මේ අතර, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) ආගන්තුක සත්කාර සහ සංචාරක ක්ෂේත්‍රය සඳහා රජය අනුමත කළ ප්‍රමුඛතම පුහුණු ආයතනය ලෙස සිය කාර්යභාරය තවදුරටත් පුළුල් කරමින් සිටී. දිවයින පුරා පිහිටි ශාඛා මධ්‍යස්ථාන හරහා SLITHM විසින් පුළුල් පරාසයක අධ්‍යයන හා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වාගෙන යන අතර, වසරකට පුහුණු වෘත්තිකයන් 6,000කට අධික පිරිසක් බිහිකරයි.

එම ආයතනය නව උපාධි මාර්ග හඳුන්වා දී ඇති අතර, කුසලතා සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. එමගින් සංචාරක කර්මාන්තයට අවශ්‍ය සුදුසුකම් සහිත මානව සම්පත් අඛණ්ඩව සැපයීම සහතික කරයි.

මෙම සියලු වැඩසටහන් එක්ව ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා වන ඒකාබද්ධ ප්‍රවේශය පිළිබිඹු කරයි. ජාත්‍යන්තර ප්‍රවර්ධනය, සංස්කෘතික උරුමය සංරක්ෂණය, තිරසාර සංවර්ධනය, වෘත්තීය පුහුණුව සහ ව්‍යාපාරික සංචාරක ව්‍යාපාරය එකට එක් කරමින් ශ්‍රී ලංකාව ගෝලීය සංචාරක සිතියමේ තවදුරටත් ඉහළට ගෙන යාම මෙහි අරමුණයි.

ශ්‍රී ලංකාවේ ආකර්ෂණීයත්වය තහවුරු කරන ජාත්‍යන්තර පිළිගැනීම් සහ ශක්තිමත් ආයතනික සහයෝගය සමඟින්, ලොව වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්ත අතරින් එකක් ලෙස සිය ස්ථානය තවදුරටත් උසස් කර ගැනීමට ශ්‍රී ලංකාව සූදානමින් සිටී.

**Media Team,**
**Sri Lanka Tourism**

**2026/06/19**

යොමු අංකය: **MOT/DMO/PR/M2**